මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | මූල්‍ය බුද්ධි ඒකකය |
| දිනය | 2025 අගෝස්තු 06 |

**මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2025 වර්ෂයේ ජනවාරි මස සිට ජූනි මස දක්වා වූ කාලපරිච්ඡේදය තුළ වාර්තාකරණ ආයතන සඳහා පරිපාලනමය දණ්ඩන පැනවීම**

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 19(1) සහ 19(2) වගන්ති මගින් පැවරී ඇති බලතල අනුව එම පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන ආයතන සඳහා පරිපාලනමය දණ්ඩන පනවනු ලැබේ. අදාල අනුකූල නොවන කටයුතුවල ස්වභාවය හා බැරෑරුම්කම සැලකිල්ලට ගෙන මෙම දණ්ඩන නියම කළ හැකිය.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නියාමන ආයතනය ලෙස ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් වාර්තාකරණ ආයතනවල අනුකූලතාව බලාත්මක කිරීම සඳහා 2025 වර්ෂයේ ජනවාරි මස සිට ජූනි මස දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පහත දක්වා ඇති පරිදි එකතු කරගන්නා ලද සමස්ත දඩ මුදල රුපියල් මිලියන හයයි දශම පහ (රු. 6,500,000.00) කි. එලෙස දණ්ඩන මගින් එකතු කරගන්නා ලද මුදල ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී.

1. **ජාතික ඉතිරි කිරීමේ බැංකුව**

| | | |
|---|---|---|
| **දණ්ඩනය පනවන ලද දිනය** | : | 2025 අප්‍රේල් 16 |
| **වටිනාකම** | : | රු. 3,500,000.00 (රුපියල් මිලියන තුනයි දශම පහකි ) |
| **දණ්ඩනය ගෙවන ලද දිනය** | : | 2025 මැයි 02 |

**දණ්ඩනය පැනවීමට හේතුව** : පහත දැක්වෙන පරිදි 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ ඒ යටතේ නිකුත් කරන ලද රීතීන්, රෙගුලාසි සහ නියෝගයන්ට අනුකූල නොවීම හේතුවෙන් මෙම දණ්ඩනය පනවන ලදී.

i. රුපියල් මිලියනයක් හෝ එයට සමාන විදේශ මුදල් වලින් වූ මුදල් ප්‍රමාණයක් ඉක්මවන මුදල් ගනුදෙනු සහ විද්‍යුත් අරමුදල් හුවමාරුවීමේ ගනුදෙනු කිහිපයක් නියමිත දින තිස් එකක් ඇතුළත මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීමට අපොහොසත් වීම.

ii. 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝග (එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා අංක 1373) සහ 2017 එක්සත් ජාතීන්ගේ (කොරියානු ප්‍රජාතන්ත්‍රික මහජන සමූහාණ්ඩුව සම්බන්ධයෙන් වන සම්බාධක) නියෝග (එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා අංක 1718) යටතේ නම් කරන ලද තැනැත්තන්, කණ්ඩායම් සහ ආයතන ලැයිස්තු යාවත්කාලීනව පවත්වාගෙන යාමට අපොහොසත් වීම.

iii. මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරන ලද තහනම් කිරීමේ නියමයන් සහ කොළඹ දී පවත්වන්නා වූ බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් පසුව දීර්ඝ කරන ලද තහනම් කිරීමේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වෙමින් ක්‍රියා විරහිත කළ ගිණුම් හරහා හර ගනුදෙනු සිදු කිරීම.

iv. පද්ධති හා කාර්ය පටිපාටි වල ඉහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය වුව ද, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාවන් යටතේ නම් කරන ලද තැනැත්තන්, කණ්ඩායම් සහ ආයතන සමග බැංකුව විසින්, ව්‍යාපාරික සම්බන්ධතා පැවැත්වූ අවස්ථා එතැන් පරීක්ෂණයේ දී අනාවරණය නොවීය.

2. **බැලිස් ලිමිටඩ්**

**දණ්ඩනය පනවන ලද දිනය** : 2025 මාර්තු 28

**වටිනාකම** : රු. 1,500,000.00 (රුපියල් මිලියන එකයි දශම පහකි)

**දණ්ඩනය ගෙවන ලද දිනය** : 2025 අප්‍රේල් 29

**දණ්ඩනය පැනවීමට හේතුව** : පහත දැක්වෙන පරිදි 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ ඒ යටතේ නිකුත් කරන ලද රීතීන්, රෙගුලාසි සහ නියෝගයන්ට අනුකූල නොවීම හේතුවෙන් මෙම දණ්ඩනය පනවන ලදි.

i. මුදල් විශුද්ධිකරණ අවදානම් සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් හඳුනාගැනීමේ, තක්සේරු කිරීමේ හා කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා අවදානම මත පදනම් වූ පිවිසුම මත පිහිටා ගනුදෙනුකරුවන් පිළිබඳ නිරන්තර නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමට අපොහොසත් වීම.

ii. මාර්ගගත ක්‍රමවේද හරහා ව්‍යාපාරික සම්බන්ධතා ආරම්භ කරන ගනුදෙනුකරුවන්ගෙන් අනන්‍යතා ලේඛනයක පිටපතක් ලබා ගැනීමට අපොහොසත් වීම.

iii. ව්‍යාපාරික සම්බන්ධතා ආරම්භ කරන අවස්ථාවේ දී, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා යටතේ නම් කරන ලද තැනැත්තන්, කණ්ඩායම් සහ ආයතන ලැයිස්තුවක ගනුදෙනුකරුවකුගේ නම, ඇතුළත්ව තිබේ ද යන්න තහවුරු කරගැනීමට සහ එවැනි ලැයිස්තුවක් යාවත්කාලීන වන අවස්ථාවක දී, ආයතනය සමග ව්‍යාපාරික සබඳතා පවත්වාගෙන යනු ලබන ගනුදෙනුකරුවකුගේ නම ඇතුළත්ව තිබේ ද යන්න තහවුරු කරගැනීමට අපොහොසත් වීම.

iv. ගනුදෙනු නියාමනය කිරීම සහ සැක කටයුතු ගනුදෙනු හඳුනා ගැනීම සඳහා ක්‍රියාපටිපාටීන් ස්ථාපිත කිරීමට අපොහොසත් වීම.

v. ගනුදෙනුකරුවන් පිළිබඳ නිරන්තර නිසි උද්යෝගයෙන් කටයුතු කිරීමට අදාල ක්‍රියාවලියේදී ලබාගන්නා ලද ව්‍යාපාරික ලිපි සහ ලේඛන ද ඇතුලුව, ගනුදෙනුකරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමට භාවිතා කළ ලේඛන පවත්වාගෙන යාමට අපොහොසත් වීම.

vi. පද්ධති හා කාර්ය පටිපාටි වල ඉහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය වුව ද, එක්සත්

ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාවන් යටතේ නම් කරන ලද තැනැත්තන්, කණ්ඩායම් සහ ආයතන සමග මෙම ආයතනය විසින්, ව්‍යාපාරික සම්බන්ධතා පැවැත්වූ අවස්ථා එතැන් පරීක්ෂණයේ දී අනාවරණය නොවීය.

3. **බෙලාජියෝ ලිමිටඩ්**

**දණ්ඩනය පනවන ලද දිනය** : 2025 මාර්තු 28

**වටිනාකම** : රු. 1,500,000.00 (රුපියල් මිලියන එකයි දශම පහකි )

**දණ්ඩනය ගෙවන ලද දිනය** : 2025 අප්‍රේල් 29

**දණ්ඩනය පැනවීමට හේතුව** : පහත දැක්වෙන පරිදි 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ ඒ යටතේ නිකුත් කරන ලද රීතීන්, රෙගුලාසි සහ නියෝගයන්ට අනුකූල නොවීම හේතුවෙන් මෙම දණ්ඩනය පනවන ලදි.

i. මුදල් විශුද්ධිකරණ අවදානම් සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් හඳුනාගැනීමේ, තක්සේරු කිරීමේ හා කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා අවදානම මත පදනම් වූ පිවිසුම මත පිහිටා ගනුදෙනුකරුවන් පිළිබඳ නිරන්තර නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමට අපොහොසත් වීම.

ii. මාර්ගගත ක්‍රමවේද හරහා ව්‍යාපාරික සම්බන්ධතා ආරම්භ කරන ගනුදෙනුකරුවන්ගෙන් අනන්‍යතා ලේඛනයක පිටපතක් ලබා ගැනීමට අපොහොසත් වීම.

iii. ව්‍යාපාරික සම්බන්ධතා ආරම්භ කරන අවස්ථාවේ දී, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා යටතේ නම් කරන ලද තැනැත්තන්, කණ්ඩායම් සහ ආයතන ලැයිස්තුවක ගනුදෙනුකරුවකුගේ නම, ඇතුළත්ව තිබේ ද යන්න තහවුරු කරගැනීමට සහ එවැනි ලැයිස්තුවක් යාවත්කාලීන වන අවස්ථාවක දී, ආයතනය සමග ව්‍යාපාරික සබඳතා පවත්වාගෙන යනු ලබන ගනුදෙනුකරුවකුගේ නම ඇතුළත්ව තිබේ ද යන්න තහවුරු කරගැනීමට අපොහොසත් වීම.

iv. ගනුදෙනු නියාමනය කිරීම සහ සැක කටයුතු ගනුදෙනු හඳුනා ගැනීම සඳහා ක්‍රියාපටිපාටීන් ස්ථාපිත කිරීමට අපොහොසත් වීම.

v. ගනුදෙනුකරුවන් පිළිබඳ නිරන්තර නිසි උද්යෝගයෙන් කටයුතු කිරීමට අදාල ක්‍රියාවලියේදී ලබාගන්නා ලද ව්‍යාපාරික ලිපි සහ ලේඛන ද ඇතුලුව, ගනුදෙනුකරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමට භාවිතා කළ ලේඛන පවත්වාගෙන යාමට අපොහොසත් වීම.

vi. පද්ධති හා කාර්ය පටිපාටි වල ඉහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය වුව ද, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාවන් යටතේ නම් කරන ලද තැනැත්තන්, කණ්ඩායම් සහ ආයතන සමග මෙම ආයතනය විසින්, ව්‍යාපාරික සම්බන්ධතා පැවැත්වූ අවස්ථා එතැන් පරීක්ෂණයේ දී අනාවරණය නොවීය.